# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2077/54 – 2018 ජුනි මස 30 වැනි සෙනසුරාදා – 2018.06.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

වත්තේගම නගර සභාව

**විනෝද බදු පැනවීම**

(267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව වත්තේගම නගර සභාවේ ලේකම් විසින් තීරණය කරන ලද පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ (2) වන උප වගන්තියෙන් පැවරී, ඇති බලතල ප්‍රකාර මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී උප වගන්තිය අනුව මෙයින් පළකරනු ලැබේ.

ආර්. එම්. පී. එස්. රත්නායක,<br>
ලේකම්,<br>
ප්‍රධාන, අධ්‍යාපන හා පළාත් පාලන අමාත්‍යාංශය,<br>
මධ්‍යම පළාත.

2018 පෙබරවාරි මස 14 වැනි දින,<br>
පල්ලෙකැලේ දී ය.

1A – PG 4094 – 32 (2018/ 06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**යෝජනාව**

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 (1) වගන්තියෙන් හා 1984 අංක 37 දරන විනෝද බදු සංශෝධිත පනත අනුව වත්තේගම නගර සභා බල ප්‍රදේශයේ විනෝද බදු අය කිරීම සඳහා ප්‍රවේශ පත්‍ර ගාස්තුවෙන් (විනෝද බදු හැර) 20% ක විනෝද බද්දක් අයකිරීම සඳහා (255 වන අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 27 (3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණය කරන්නීය.

07 - 463

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.